සුවෙන් පෙරට

e - ඉගෙනුම් පියස

මිනුවන්ගොඩ

අධ්‍යාපන කලාපය

| දෙවන වාරය | | |
|---|---|---|
| ශ්‍රේණිය : 1 ශ්‍රේණිය | විෂය : ගණිතය | පාඩම : දිග සැසඳීම |

## 1 පාඩම - දිග සැසඳීම

## පෙර සූදානම

- ගිනි පෙට්ටි කිහිපයක් , පාට පැන්සල් කිහිපයක් ,මකනය ,අඩි රූල ළඟට ගන්න.

## පැවරුම

- දුවේ, පුතේ පහත කෝච්චි දෙක දිහා බලන්න. මේ කෝච්චි දෙකෙන් දිගම කෝච්චිය කොයි එකද කියලා බලන්න නිල් පාට ඉර කෙලින් කෝච්චි දෙකම තිබ්බා. දැන් හොඳට පෙනෙනවා නේද ළමයි ඉන්න කෝච්චිය දිගින් වැඩියි කියලා



- දැන් ඔයාලා  පාට පැන්සල් දෙකක් අරගෙන එක් කෙලවරක් එක කෙලින් පහත පරිදි තබා දිගින් වැඩි පැන්සල  කොයි එකද කියලා කියන්න.



- දැන් ඔයාලා මකනය ,අඩි රූල අරගෙන එක් කෙලවරක් එක කෙලින් පහත පරිදි තබා දිගින් අඩු කොයි එකද කියලා කියන්න.





- දුවේ පුතේ දැන් ඔයාලා හිස් ගිනි පෙට්ටි අරගෙන පහත පේන පරිදි එකිනෙක සම්බන්ධ කර කොට කෝච්චියකුයි දිග කෝච්චියකුයි හදන්න.






## දුවේ පුතේ මේ වැඩ ටිකත් අපි කරමු.

- දිග වැඩි රූපය පාට කරන්න.



- දිග අඩු රූපය පාට කරන්න.



### පසු වැඩ

- දිගින් වැඩි පැන්සල මොන පාටද ?
- අඩි රූල හා මකනයක රූප 2ක් අලවා කොට රූපය රවුම් කරන්න.
- දිග සහ කොට පැන්සල් දෙකක් අඳින්න. දිග පැන්සල පාට කරන්න.